පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 223

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
නවවැනි පාර්ලිමේන්තුව
(තෙවැනි සැසිවාරය)

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාව

(නොරොච්චෝලේ ලක්විජය ගල් අඟුරු බලාගාරය සඳහා 2022-2025 කාලපරිච්ඡේදයට අදාළව ගල් අඟුරු මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඇගැයීම සම්බන්ධයෙන් 2022.11.09 දින පැවැත්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේ දී සාකච්ඡා කරන ලද කරුණු සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන විශේෂ වාර්තාව)

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති
පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා විසින්
2023 ජනවාරි මස 17වන දින ඉදිරිපත් කරන ලදී

2023 ජනවාරි මස 17 වන දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මුද්‍රණය කළ යුතු යැයි නියෝග කරන ලදී

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව

නවවැනි පාර්ලිමේන්තුව (තෙවැනි සැසි වාරය)

2022 ඔක්තෝබර් මස 08 වැනි දින ගරු කථානායකතුමා විසින් සිදු කරන ලද නිවේදනය අනුව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120 හි විධිවිධාන සහ 2022 අගෝස්තු මස 29 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනා ප්‍රකාරව තේරීම් කාරක සභාව විසින් නවවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සැසි වාරය සඳහා වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සඳහා පහත සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 30දෙනෙකු පත් කරන ලදී.

1. ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා, පා.ම.,
2. ගරු ජගත් පුෂ්පකුමාර මහතා, පා.ම.,
3. ගරු ජානක වක්කුඹුර මහතා, පා.ම.,
4. ගරු ලොහාන් රත්වත්තේ මහතා, පා.ම.,
5. ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා, පා.ම.,
6. ගරු ඩී. වී. චානක මහතා, පා.ම.,
7. ගරු ශාන්ත බණ්ඩාර මහතා, පා.ම.,
8. ගරු අනුර දිසානායක මහතා, පා.ම.,
9. ගරු නීතීඥ රවුෆ් හකීම් මහතා, පා.ම.,
10. ගරු පාඨලී චම්පික රණවක මහතා, පා.ම.,
11. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා, පා.ම.,
12. ගරු දයාසිරි ජයසේකර මහතා, පා.ම.,
13. ගරු රෝහිත අබේගුණවර්ධන මහතා, පා.ම.,
14. ගරු ඉරාන් වික්‍රමරත්න මහතා, පා.ම.,
15. ගරු නිමල් ලාන්සා මහතා, පා.ම.,
16. ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා, පා.ම.,
17. ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා, පා.ම.,
18. ගරු එස්. එම්. මරික්කාර් මහතා, පා.ම.,
19. ගරු මුජීබුර් රහුමාන් මහතා, පා.ම.,
20. ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය, පා.ම.,
21. ගරු සංජීව එදිරිමාන්න මහතා, පා.ම.,
22. ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා, පා.ම.,
23. ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා, පා.ම.,
24. ගරු නීතීඥ ප්‍රේමිනාත් සී. දොලවත්ත මහතා, පා.ම.,
25. ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා, පා.ම.,
26. ගරු එම්. රාමේෂ්වරන් මහතා, පා.ම.,
27. ගරු ඥානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා, පා.ම.,
28. ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය, පා.ම.,
29. ගරු නීතීඥ මධුර විතානගේ මහතා, පා.ම.,
30. ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා, පා.ම.,

කාරක සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වත්මන් කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

- ❖ සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) - නිශාන්ති එස්. වික්‍රමරත්න මිය
- ❖ ප්‍රධාන නිලධාරී - සී. එම්. සුබසිංහ මිය
- ❖ නියෝජ්‍ය ප්‍රධාන නිලධාරී - එස්. ඒ. එම්. ෂහීඩ් මයා
- ❖ සහකාර ප්‍රධාන නිලධාරී - ජී. ආර්. යූ. ගමගේ මිය
- ❖ සහකාර ප්‍රධාන නිලධාරී - ඩබ්ලිව්. එල්. එස්. ඩී. ද අල්විස් මිය
- ❖ සහකාර ප්‍රධාන නිලධාරී - යූ. එස්. ප්‍රභාෂිනී මිය
- ❖ පාර්ලිමේන්තු නිලධාරී - ආර්. සී. කුලතිලක මිය
- ❖ පාර්ලිමේන්තු නිලධාරී - ජී.එම්. එච්. එස්. ගම්ලත් මිය
- ❖ පාර්ලිමේන්තු නිලධාරී - ජී. වී. එස්. කේ. කුමාරි මෙය
- ❖ පාර්ලිමේන්තු නිලධාරී - අයි. එස්. ගෝමස් මිය

කාරක සභා වාර්තා

www.parliament.lk යන වෙබ් අඩවියෙන් පහත සඳහන් ගමන් මාර්ගය ඔස්සේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තා බා ගත කළ හැක.

www.parliament.lk ⟶ සිංහල ⟶ ප්‍රකාශන ⟶ කාරක සභා වාර්තා

පටුන

පිටු අංක

1. සභාපතිතුමාගේ සටහන v

2. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නවවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සැසිවාරයේ පළමුවැනි වාර්තාව vii

3. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය 1

4. පොදු ව්‍යාපාර කාරක සභාව මගින් විමර්ශනය කරන ලද විශේෂ විගණන වාර්තාව සහ විමර්ශනයට ලක් කරන ලද ආයතන 3

5.ඇමුණුම **01** - නොරොච්චෝලේ ලක්විජය ගල් අඟුරු බලාගාරය සඳහා 2022-2025 කාලපරිච්ඡේදයට අදාළව ගල් අඟුරු මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඇගැයීම සම්බන්ධයෙන් වූ විශේෂ විගණන වාර්තාව

සභාපතිතුමාගේ සටහන

වර්තමානයේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කටයුතු පිළිබඳ මහජන අවධානය, පෙර කවරදාටත් වඩා වැඩි වී ඇත. රටේ ආර්ථිකය විශාල පසුබෑමකට ලක් ව ඇති අවස්ථාවක එදිනෙදා කටයුතු පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් රටක් ලෙස අප මුහුණ දුන් අභියෝග අතිමහත් ය. ඒ අතරට රාජ්‍ය සම්පත් පරිහරණය කිරීම හා ඒ වෙනුවෙන් අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත් ද අභියෝගයට ලක් වූ අවස්ථාවන් පිළිබඳව අප කාරක සභාවට කරුණු විමසීමට සිදු විය.

එවැනි එක් තීරණාත්මක අවස්ථාවක් වන්නේ නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය සඳහා වර්ෂ 2022-2025 කාල පරිච්ඡේදයට අදාළව ගල් අඟුරු මිල දී ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් විගණකාධිපතිතුමාගේ වාර්තාව විමසා බැලීමයි.

ඒ සම්බන්ධයෙන් මෙම කාරක සභාවේ වගකීම භාරගෙන කටයුතු කළ සියලු දෙනාගේම මෙහෙය අප අගය කළ යුතුය. විශේෂයෙන්ම ජනතා අවධානයට ලක්වන කරුණු සම්බන්ධයෙන් විගණකාධිපතිතුමාගේ අවධානය යොමු කරවීම සහ ඒවා සම්බන්ධයෙන් ඵලදායී ලෙස කරුණු විමසීම සඳහා කඩිනමින් කටයුතු කිරීම අගය කළ යුතුය.

මෙම විශේෂ විගණන වාර්තාව පිළිබඳ ව ඉතා තීව්‍ර මහජන අවධානයක් යොමු වී තිබීම අප කමිටුවේ කාර්යය තරමක් තීරණාත්මක කිරීමට බලපෑ බව නොරහසකි. එමෙන්ම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව පත් කර නොතිබුණු අවස්ථාවක, මුදල් කාරක සභාව විසින් ඒ සම්බන්ධයෙන් කරනු ලැබූ විමර්ශන පිළිබඳව අපගේ අවධානය යොමු කළ යුතුව තිබිණ. ඒ පිළිබඳව විගණකාධිපතිතුමාගෙන් ලද සහයෝගය මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුතුය. විශේෂයෙන් ආර්ථික අර්බුදකාරී අවස්ථාවක් පවතිද්දී ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුකූලව කටයුතු කිරීම කොතරම් අභියෝගයක් ද යන්න පිළිබඳව එතුමාගේ අවධානය යොමු වී තිබුණි. එමෙන්ම එවැනි අවස්ථාවලදී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව විශේෂ සඳහනක් ද අනාගතයේදී ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව ද යම් ඉඟියක් මෙම විශේෂ විගණන වාර්තාවට ඇතුළත් කර ඇත.

විගණකාධිපතිතුමාගේ වාර්තාව විමසා බලමින්, අදාළ කටයුත්තට සම්බන්ධ සියලුම පාර්ශ්ව කාරක සභාව හමුවට කැඳවා අප විසින් දීර්ඝ කරුණු විමසීමකට පසුව, විගණකාධිපතිගේ නිර්දේශ එලෙසම ක්‍රියාත්මක කිරීම සඳහා වන පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශය ද මෙමඟින් ඉදිරිපත් කරන ලදී. එමෙන්ම ගල් අඟුරු මිල දී ගැනීම සඳහා කැඳවන ලද ලංසු, ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුකූල ලෙස ක්‍රියාවට නැංවීම, කොතරම් අභියෝගාත්මක ද යන්න කමිටුවේ අවධානයට ලක් විය. ඒ පිළිබඳව ද මෙම වාර්තාවේ විශේෂ සටහනක් තබා ඇත.

මෙම විමර්ශන කටයුතු සඳහා දායක වූ කාරක සභාවේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ටත්, මෙම විශේෂ විගණන වාර්තාව සකස් කොට, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කටයුතු සම්බන්ධයෙන් විගණකාධිපති සහ ඔහුගේ කාර්ය මණ්ඩලය ඉටු කරන සේවාව වෙනුවෙන් මාගේ ගෞරවණීය ස්තූතිය පිරිනමමි.

එමෙන්ම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා කාර්යාලයේ ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයටත්, මෙම වාර්තාව පරිවර්තනය කිරීමේ කටයුතුවලට සහයෝගය දැක්වූ පරිවර්තන අංශයේ සැමටත් මාගේ ගෞරවණීය ස්තුතිය පිරිනැමේ.

මහාචාර්ය රංජිත් බණ්ඩාර,
සභාපති,
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව

නවවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සැසිවාරය
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාව

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව එහි නවවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සැසිවාරයේ පළමුවැනි වාර්තාව ඉදිරිපත් කරන්නේ සතුටිනි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව අනුව විගණකාධිපතිවරයා විසින් ආණ්ඩුවේ සියලු රාජ්‍ය සංස්ථා ද යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරනු ලැබ ඇති වෙළඳ ව්‍යාපාර සහ වෙනත් ව්‍යාපාර සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගම් ද ඒවායේ ගිණුම් ද, පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මඟින් පරීක්ෂාවට භාජනය කරනු ලබයි.

ඒ අනුව, නොරොච්චෝලේ ලක්විජය ගල් අඟුරු බලාගාරය සඳහා 2022-2025 කාලපරිච්ඡේදයට අදාළව ගල් අඟුරු මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඇගැයීම සම්බන්ධයෙන් වූ විශේෂ විගණන වාර්තාවේ සඳහන් කරුණු පිළිබඳව 2022.11.09 වැනි දින පැවැත්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ විශේෂ විමර්ශනයට ලක් වූ නිරීක්ෂණ සහ නිර්දේශ මෙම වාර්තාවට අන්තර්ගත කර ඇත.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය

ලංකා ගල් අඟුරු සමාගම විසින් 2020 සහ 2021 වර්ෂයන්ට අදාළව ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිගේ මතය පහතින් දක්වා ඇත.

1. **තත්ත්වාගණනය නොකළ මතය (Unqualified Opinion)**
   විගණකාධිපතිට ආයතනයේ ගිණුම් තුළ සැලකිය යුතු උල්ලංඝනය කිරීම් හෝ අවප්‍රකාශයන් හඳුනාගැනීමට නොහැකි බව.

2. **තත්ත්වාගණනය කළ මතය (Qualified Opinion)**
   ආයතනය ඉදිරිපත් කර ඇති මූල්‍ය තොරතුරු ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව වාර්තා නොවීම හෝ ඒවා තහවුරු කිරීමට ලේඛනගත සාක්ෂි හඳුනාගැනීමට නොහැකි බව.

3. **මතය ව්‍යාවනය කිරීම (Disclaimer of Opinion)**
   ප්‍රමාණවත් හෝ උචිත විගණන සාක්ෂි හඳුනාගැනීමට නොහැකිවීම නිසා ගිණුම් සම්බන්ධව මතයක් ප්‍රකාශ කළ නොහැකි බව.

4. **අහිතකර මතය (Adverse Opinion)**
   සාවද්‍ය හෝ විශ්වාස කළ නොහැකි තොරතුරු නිසා ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළ සැලකිය යුතු ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් හමු වූ බව.

	ආයතනය	විගණන මතය	
		2020	2021
01	ලංකා ගල් අඟුරු සමාගම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ

<u>ලංකා ගල් අඟුරු සමාගම</u>

(විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය)

විමර්ශනය කරන ලද දිනය: 2022.11.09

<u>සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු</u>

01. <u>විගණකාධිපතිගේ ආරම්භක පැහැදිලි කිරීම</u>

සාකච්ඡාව ආරම්භයේ දී විගණකාධිපති විසින් පහත පැහැදිලි කිරීම සිදු කරන ලදී.

- නොරොච්චෝලේ ලක්විජය ගල් අඟුරු බලාගාරය සඳහා 2022-2025 කාලපරිච්ඡේදයට අදාළව ගල් අඟුරු මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් කාලීනව උද්ගත වී තිබූ මතභේදාත්මක තත්ත්වය සලකා බලා විගණකාධිපති විසින් මෙම කරුණ සම්බන්ධව විශේෂ විගණනයක් ආරම්භ කර කටයුතු කරමින් පැවැති බව.

- නමුත් දින 35ක් වැනි කෙටි කාලයක් තුළදී එනම්, 2022.07.21 දින සිට 2022.08.25 දින දක්වා පැවැති මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසානයේ Black Sand Commodities FZ-LLC සමාගම වෙත ටෙන්ඩරය පිරිනැමීම සම්බන්ධව පරීක්ෂා කිරීම සඳහා රජයේ ව්‍යාපාර පිළිබඳ කාරක සභාව හෝ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව එවකට ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවති බැවින්, විදුලිබල හා බලශක්ති අමාත්‍යාතුමාගේ ඉල්ලීම පරිදි ගරු කථානායකතුමා විසින් මේ පිළිබඳව පරීක්ෂාවක් සිදු කරන ලෙසට රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා වෙත ලබා දුන් උපදෙස් පරිදි හා 2022 සැප්තැම්බර් 08වැනි දින රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ පැවැති සාකච්ඡාවේදී එකඟ වූ පරිදි 2022 සැප්තැම්බර් මස 30 වන දින මෙම වාර්තාව නිකුත් කරනු ලැබූ බව.

- මෙම ගනුදෙනුව, එම ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි සැපයුම්කරුවන් තෝරා ගැනීම සම්බන්ධයෙන් නීත්‍යානුකූලව ඇති වූ ගැටලුකාරී තත්ත්වයකින්ද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ උල්ලංඝනය කිරීම නිසා උද්ගත වූ තත්ත්වයකින් ද සමන්විත වන බව

- 2022-2025 දක්වා කාලපරිච්ඡේදයට අදාළව නොරොච්චෝලේ ලක්විජය ගල් අඟුරු බලාගාරය සඳහා ගල් අඟුරු මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඇගැයීම සම්බන්ධයෙන් විගණකාධිපතිගේ නිර්දේශ සහ රජයේ ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ, වෙන වෙනම බලපැවැත්වෙන බව

- SUKE AG සමාගම වෙනුවෙන් එහි නියෝජිතයෙකු ලෙස Black Sand Commodities FZ-LLC සමාගමේ ඉදිරිපත් වන බවට කිසිම ලංසු ලියවිල්ලක ඇතුලත් නොවන බැවින් ලංසු විවෘත කිරීමේ කමිටුව ඒ පිළිබඳව පූර්ව නිගමනයක සිටියාද යන වග ගැටලු සහගත බව

- ලංසු ලියවිලි අනුව Black Sand Commodities FZ-LLC සමාගම, SUKE AG සමාගමේ නියෝජිතයෙකු නොවන වෙනත් ස්වාධීන ආයතනයක් ලෙස විගණකාධිපති විසින් නිරීක්ෂණය කරනු ලැබ ඇති බව

02. <u>පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා සභාපතිගේ පැහැදිලි කිරීම</u>

මෙහිදී සාකච්ඡාවට භාජනය කරනු ලබන විශේෂ විගණන වාර්තාවෙන් මූලික කරුණු 04ක් සාරාංශ ගත කර ඇති කරුණු වන,

i. ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැර වීම
ii. SUKE AG සමාගම සහ Black Sand Commodities FZ-LLC සමාගම අතර ඇති නීත්‍යානුකූල බැඳීම පිළිබඳව ඇති අදහස
iii. SUKE AG සමාගම වෙනුවෙන් එහි නියෝජිතයෙකු ලෙස Black Sand Commodities FZ-LLC සමාගම විසින් කටයුතු කරන්නේද යන බව
iv. මේ සම්බන්ධව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම

යන්න පිළිබඳව පැහැදිලි කිරීම් සිදු කළ යුතු බවට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා සභාපතිගේ අදහස විය.

03. <u>විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ (ප්‍රසම්පාදන කමිටු සාමාජික) පැහැදිලි කිරීම</u>

- නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය සඳහා ගල් අඟුරු ප්‍රසම්පාදන කටයුතු පැවරුනේ රට තුළ උද්ගත වී තිබූ කලබලකාරී ස්වභාවයත් සමඟ වන බව,
- සාමාන්‍යයෙන් ප්‍රසම්පාදන කටයුත්තක් ආරම්භ කිරීමේ දී ඒ සඳහා අරමුදල් පැවතීම අත්‍යවශ්‍ය කරුණක් වුවද නමුත් මේ අවස්ථාවේ දී කිසිදු අරමුදලක් ඒ අවස්ථාවේ දී සම්පාදනය කර නොතිබූ බව,
- පසුගිය වර ප්‍රසම්පාදනයේ ගල් අඟුරු තොග සඳහා ද තවමත් ගෙවීම් කිරීමට ඇති බව සහ සමහර ගල් අඟුරු තොග බෑමේ කටයුතු ද තවදුරටත් සිදු කිරීමට ඇති බව,
- නමුත් උදාහරණයක් ලෙස විදුලිබල මණ්ඩලයේ ආදායම එදිනෙදා වියදම් පියවීමට තරම්වත් ප්‍රමාණවත් නොවූ බැවින්, පසුබිමෙන් ඇති වූ මෙවැනි බාධා මධ්‍යයේ වුවද ඉදිරියට යා හැකි අන්දම පිළිබඳව මුදල් අමාත්‍යාංශයේ සහ මහා භාණ්ඩාගාරයේ නිලධාරීන් සමඟ ද ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සමඟ සාකච්ඡා කිරීමට යොමු වූ බව,
- පැවැති ගල් අඟුරු තොග ප්‍රමාණවත් වූයේ 2022 ඔක්තෝබර් මස 15වැනිදා දක්වා පමණක් බව,
- අනෙකුත් බලාගාර මෙන් නොව මෙම නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය සඳහා ගල් අඟුරු ගෙන ආ හැක්කේ සැප්තැම්බර්/ ඔක්තෝබර් මස සිට අප්‍රේල් මස බටහිර වෙරළ නිරිත දිග මෝසම් වැසි රහිත සමය තුළ දී පමණක් බව,
- අදාළ දේශගුණික තත්ත්ව සලකා බැලීමෙන් පසුව ගල් අඟුරු ගොඩ බෑමට හැකි කාලය වන්නේ සැප්තැම්බර් මස අවසානයේ දී සහ ඔක්තෝබර් මාස මුල

දී ආරම්භ කර අප්‍රේල් මස 20වැනි දිනයට ආසන්න කාලයේ දී ගොඩබෑම අවසන් කළ යුතු බව,

- ඒ අනුව එම කාල පරිච්ඡේදය ඇතුලුව ඊට පසු මාස 06ක් පමණ කාලයක් සඳහා ප්‍රමාණවත් වන පරිදි ගල් අඟුරු තොග ගබඩා කර පවත්වා ගත යුතු වන බව,
- මෙම ක්‍රියාවලියේ දී එක් නෞකාවක හෝ සිදු වන ප්‍රමාදය නිසා ඉදිරි කාලය තුළ දී බලාගාර ක්‍රියාත්මක කළ නොහැකි තත්ත්වයකට පත් වන බව,
- 2022 ජූලි මස වන විට මෙම ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂා කළ ද ඒ වන විට රටේ උද්ගත වී පැවැති තත්ත්වය හමුවේ ඒ සඳහා ඉඩප්‍රස්ථාව නොලද බව,
- ඒ අනුව අදාළ ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය නිසා මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය දින 21කට සීමා කරමින් සිදු කළ බව,
- මේ සඳහා ප්‍රසම්පාදන කමිටුවට සහාය දක්වන තාක්ෂණික කමිටුවේ උපදෙස් සහ බලාගාර ක්‍රියාත්මක කරන නිලධාරීන්ගේ සහායද ලබා ගැනීමට කටයුතු කළ බව සහ
- මෙම කරුණු පිළිබඳව අදාළ පරිදි කැබිනට් මණ්ඩලයට දැනුම් දී ඇති බව යි.

මෙහිදී කාරක සභාවේ නිරීක්ෂණය වූයේ;

- 2022 ඔක්තෝබර් මස 15වැනිදා වන විට ගල් අඟුරු තොග අවසන් වීමේ අවදානමක් රටේ උද්ගත වී නොතිබූ බව,
- ඊට හේතුව නම් 2021 – 2022 ප්‍රසම්පාදන කාල පරිච්ඡේදය අවසන් වන තෙක්ම වාර්ෂික ගල් අඟුරු අවශ්‍යතාවයෙන් 50%ක් දීර්ඝ කාලීන ප්‍රසම්පාදන යටතේ සහ ඉතිරි 50%ක ප්‍රමාණය ක්ෂණික ප්‍රසම්පාදන (Sopt Tenders) මඟින් සපුරා ගෙන තිබූ බව,
- ඒ අනුව 2021-2022 කාල පරිච්ඡේදය තුළ දී ගල් අඟුරු මෙට්‍රික් ටොන් මිලියන 2.25ක් මිල දී ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද දීර්ඝ කාලීන ප්‍රසම්පාදන ගිවිසුම අනුව ගල් අඟුරු මෙට්‍රික් ටොන් මිලියන 1.125ක් සපයා තිබූ අතර, එතෙක් සැපයුම් නොකළ ගල් අඟුරු මෙට්‍රික් ටොන් මිලියන 1.125ක් නැව් තොග 19ක් මඟින් සැපයීමට නියමිතව තිබූ බව,
- තවද, ක්ෂණික ප්‍රසම්පාදන යටතේ සැපයිය යුතු නමුත් එතෙක් සැපයුම් නොකළ නැව් තොග 02ක් ද 2022-2023 වාරය තුළ දී සැපයීමට නියමිතව තිබූ බව සහ
- එබැවින් දැනටමත් පිරිනමන ලද ගල් අඟුරු මෙට්‍රික් ටොන් මිලියනයකට ආසන්න ප්‍රමාණයක තොගයක් ලැබීමට නියමිතව තිබිය දී නව හදිසි ප්‍රසම්පාදනයකට යෑමේ කිසිදු අවශ්‍යතාවයක් නිරීක්ෂණය නොකරන බව යි.

ඉහත කරුණු සම්බන්ධව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම් විසින් නැවත පැහැදිලි කරමින් කරුණු දක්වන ලද්දේ;

- ඉහතින් සඳහන් කරන ලද පසුගිය වාරයේ ක්ෂණික ප්‍රසම්පාදනය යටතේ SUKE AG ආයතනයෙන් ලැබීමට නියමිතව තිබූ නැව් තොග 02ක ප්‍රමාණයක

ගල් අඟුරු සඳහා ගෙවීම් කිරීමට නෙහැකි වූ බැවින් එම ගල් අඟුරු තොග මිල දී ගැනීමට නොහැකි වූ බව,

- නමුත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය රැගෙන එම තොග මේ වාරයේ ලබා ගැනීමට නියමිතව තිබූ නමුත් අවශ්‍යතාවය සඳහා එම නැව් 02ක තොග ප්‍රමාණවත් නොවන බව,
- ඊට අමතරව 2020 දී කැඳවා තිබූ දීර්ඝ කාලීන ටෙන්ඩරය (Term Tender) යටතේ ගල් අඟුරු මෙට්‍රික් ටොන් මිලියන 1.2 තොගයක් ලැබීමට නියමිතව තිබූ නමුත් එය ලබා ගත හැකි වන්නේ 2022 දෙසැම්බර් මාසයේ සිට බව,
- මෙහිදී ගල් අඟුරු හිඟතාවයක් දෘශ්‍යමාන නොවන්නේ ඒ වන විට විදුලිබල කප්පාදුවක් පැවතීම, යන්ත්‍රාගාර කටයුතු හදිසියේ අඩපණ වීම සහ ඒවායේ අලුත්වැඩියා කටයුතු සිදු කළ යුතු වීම ආදී කරුණු නිසා බව සහ
- නමුත් සාමාන්‍ය ප්‍රතිපත්තිය වන්නේ මෙහි පවතින යන්ත්‍රාගාර 03ම ක්‍රියාත්මක තත්ත්වයේ පවත්වා ගැනීමට නම් අවශ්‍ය ගල් අඟුරු ප්‍රමාණය ආයතනය සතුව පවතින බවට සහතික විය යුතු බව යි.

දැනට පවතින ගල් අඟුරු තොග සම්බන්ධව කාරක සභාව විසින් සිදු කරන ලද විමසීම් සඳහා ලංකා ගල් අඟුරු සමාගමේ අතිරේක සාමාන්‍යාධිකාරී (තාක්ෂණික ප්‍රසම්පාදන කමිටු සභාපති) විසින් ප්‍රකාශ කරන ලද්දේ;

- දැනට ගල් අඟුරු මෙට්‍රික් ටොන් 120,000ක ප්‍රමාණයක තොගයක් පවතින බව,
- එම ප්‍රමාණය 2022 ඔක්තෝබර් මස 25 සහ නොවැම්බර් මස පළමු සතිය තුළ මෙට්‍රික් ටොන් 60,000 බැගින වන නැව් 02ක් මඟින් ලබා ගැනීමට කටයුතු කර ඇති බව,
- එයින් දිනකට මෙට්‍රික් ටොන් 5,000ක් බැගින් පාවිච්චි කරමින් සිටින බව සහ
- දැනට යන්ත්‍රාගාර 02ක් ක්‍රියාත්මක තත්ත්වයේ පවතින බව යි.

04. <u>විගණකාධිපතිගේ නිරීක්ෂණ අනුව කාරක සභාවේ අවධානය යොමු වූ කරුණු</u>

1. අමාත්‍යාංශ ලේකම් විසින් 2022.09.22 දින අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති සංදේශයේ නිර්දේශ අංක 3(ආ) i යටතේ Blank Sand Commodities වෙත අංක 05 සෘජු ප්‍රසම්පාදනයෙන් නැව් වාර 02ක් ප්‍රදානය කර ඇති බව සඳහන් කර තිබුණ ද එම සමාගම වෙත එලෙස ප්‍රසම්පාදනයක් ලබා දී නොතිබීම හේතුවෙන් ලේකම්වරයා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත නිරවද්‍ය නොවන සහ තහවුරු කල නොහැකි තොරතුරු ද ඉදිරිපත් කර තිබීම.

2. King Stone Group මඟින් ඉන්දුනීසියානු කලාපය සඳහා ඉදිරිපත් කර ඇති මිල ගණන්, ඉදිරිපත් වී ඇති අනෙකුත් මිල ගණන්වලට සාපේක්ෂව සැලකිය යුතු පහළ අගයක් ගන්නා බැවින් හා ණය පදනම මත ද සැපයීමට යෝජනා කර ඇති බැවින් එම යෝජනාව සම්බන්ධයෙන් සැපයුම්කරු සමඟ සාකච්ඡා කිරීමේ හැකියාවක් තිබියදීත් ඒ සඳහා කිසිදු උත්සාහයක් ගෙන නොතිබීම.

3. 2022 අගෝස්තු 02 වන දින ලංකා ගල් අඟුරු සමාගම විසින් SUEK AG වෙනුවට Black Sand Commodities සමඟ ගනු දෙනු පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳව නීතිපති විමසා, ඒ සඳහා නීතිපති මතය ලැබීමට පෙර ලංසු ලේඛනවල පහත සඳහන් පරිදි **ප්‍රබල හා සංවේදී** සංශෝධනයන් සිදු කිරීමට කටයුතු කර තිබීම.

"ලියාපදිංචි සැපයුම්කරුවන්ට ඔවුන් වෙනුවෙන් ලංසු ඉදිරිපත් කිරීමට වෙනත් හවුල්කරුවෙකු හෝ වෙනත් සමාගමක් සමඟ සම්බන්ධවීමට හෝ වෙනත් ආකාරයකින් සම්බන්ධවීමට ලංකා ගල් අඟුරු සමාගම අවසර දෙනු ලබයි. කෙසේ වෙතත් සපයනු ලබන ගල් අඟුරුවල ගුණාත්මකභාවය සහ ප්‍රමාණය සහ ඒ සඳහා ගෙවීම් ලියාපදිංචි ගල් අඟුරු සැපයුම්කරු සහ හෝ ඔවුන්ගේ බද්ධ ව්‍යාපාරයේ හවුල්කරු සහ හෝ ඔවුන්ගේ පැවරුම්ලාභියා විසින් සම්පූර්ණයෙන්ම සුරක්ෂිත කළ යුතුය."

05. <u>පූර්ව ප්‍රසම්පාදන රැස්වීම</u>

SUEK AG සමාගම විසින් ලංකා ගල් අඟුරු සමාගමේ සභාපති වෙත 2022.07.27 දින ඉදිරිපත් කරන ලද ලිපියක් මඟින් සිය ලියාපදිංචිය Black Sand Commodities ලෙස වෙනස් කිරීමට ඉල්ලීමක් කර තිබුණි. අදාළ ඉල්ලීම සිදු කිරීමෙන් පසු දින, එනම් 2022.07.28 දින, පූර්ව ප්‍රසම්පාදන රැස්වීම පවත්වා තිබූ අතර එහිදී එම ලියාපදිංචිය වෙනස්කිරීම සම්බන්ධයෙන් කිසිදු ඉල්ලීමක් SUEK AG සමාගම විසින් සිදු කර නොතිබුණි. එසේම, පූර්ව ප්‍රසම්පාදන රැස්වීමේ දී මේ පිළිබඳ කිසිදු සාකච්ඡාවක් සිදු කර නොතිබීම සම්බන්ධව කාරක සභාවේ විශේෂ අවධානය යොමු විය.

තවද, Black Sand Commodities සමාගම මෙම ප්‍රසම්පාදනයේ පාර්ශ්වකරුවෙකු ලෙස යොදා ගන්නා ලෙසට කර තිබූ ඉල්ලීමට නිසි ලිඛිත ප්‍රතිචාරයක් දැක්වීමට කටයුතු නොකිරීම තුළ Black Sand Commodities සමාගමට තම අපේක්ෂාව ඉටු වන බවට විශ්වාසයක් ඇති කිරීමට ප්‍රසම්පාදන අස්ථිත්වය එනම් ලංකා ගල් අඟුරු සමාගම විසින් කටයුතු කර ඇති බවට වූ විගණකාධිපතිගේ නිරීක්ෂණ පිළිබඳව ද කාරක සභාවේ අවධානය යොමු වූ අතර පූර්ව ප්‍රසම්පාදන රැස්වීමේ දී මේ පිළිබඳ කිසිදු සාකච්ඡාවක් සිදු නොකිරීම තුළ මේ පිළිබඳව චේතනාත්මකවම සෙසු ලංසුකරුවන්ට අනාවරණය කිරීම වැළැක්වීමක් සිදු වී ඇති බවට කාරක සභාවේ අදහස විය.

06. <u>තනි දර්ශකය වෙනුවට සංයුක්ත දර්ශකයක් හඳුන්වා දීම</u>

ස්ව කැමැත්තෙන් ඉදිරිපත් කරන ලද යෝජනාවක් අනුව (Unsolitited Proposal) King Stone Group විසින් කලාපීය මිල දර්ශකය මත සාකච්ඡා කළ හැකි බව දන්වා තිබියදීත් ඒ සඳහා යොමු නොවීම පිළිබඳව කාරක සභාව විසින් විමසීම් කරන ලදී.

තවද, 5වන ක්ෂණික ප්‍රසම්පාදනය සඳහා භාවිතා කර ඇත්තේ API 6 සහ API 4 දරන දර්ශක දෙකෙහි එකතුවකි. එහෙත් API 6 දර්ශකය යනු ඕස්ට්‍රේලියානු ගල් අඟුරු මිල නිරූපනය කරන දර්ශකයකි. ලක්විජය ගල් අඟුරු බලාගාරයට අවශ්‍ය ගල් අඟුරු දකුණු අප්‍රිකාව, ඉන්දුනීසියාව හා රුසියාව යන රටවලින් පමණක් සපයා ඇති පසුබිමක ඉන්දුනීසියාව හා රුසියානු කලාපයන්හි මිල දර්ශක භාවිතා නොකර ඒ වෙනුවට ඉහළ

අගයක් ගනු ලබන API 6 සහ API 4 හි සංයුක්ත දර්ශකයක් භාවිතා කිරීම පිළිබඳව ද කාරක සභාව විසින් දීර්ඝවශයෙන් සාකච්ඡා කරන ලදී.

මෙහිදී ප්‍රසම්පාදන කමිටුව විසින් අදහස් දක්වමින් පැහැදිලි කරන ලද්දේ, මේ පිළිබඳව විවිධ ආයතනවලින් විශේෂඥ උපදෙස් ලබා ගැනීමට කටයුතු කළ අතර ඒ සෑම ආයතනයකම උපදේශය වූයේ තනි දර්ශකයක් මත යැපීමෙන් තොරව කලාපීය දර්ශකයක් හඳුන්වා දීම තුළ ජාත්‍යන්තරයේ කලින් කලට ඇති වන අවාසි සහගත අවස්ථාවලදී පවා ඔරොත්තු දීමට එයින් හැකියාව ලැබෙන බව යි.

07. <u>විගණකාධිපතිගේ නිර්දේශ</u>

නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය සඳහා 2022-2025 කාලපරිච්ඡේදයට අදාළව ගල් අඟුරු මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඇගැයීම සම්බන්ධයෙන් වූ විශේෂ විගණන වාර්තාවේ සඳහන් පරිදි පහත දැක්වෙන විගණකාධිපති නිර්දේශ කෙරෙහි කාරක සභාවේ අවධානය යොමු කරන ලදී.

1. ගල් අඟුරු ප්‍රසම්පාදන ක්‍රියාවලියට සම්බන්ධ සියලු පාර්ශ්ව රජයේ අනුමත ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව සිය වගකීම නිවැරදිව ඉටු කරනු ලබන බවට තහවුරු කිරීම හා එම තත්ත්වයෙන් බැහැර වන පාර්ශ්වයන්ට එරෙහිව සුදුසු ඉදිරි පියවර ගැනීමේ අවශ්‍යතාවය අවධාරණය කිරීම.
2. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2 ඡේදයේ සඳහන් අරමුණුවලට අගතියක් නොවන පරිදි සහ සැපයුම්කරුවන්ගේ මූල්‍ය ශක්‍යතාවය, පළපුරුද්ද, සැපයුමේ ගුණාත්මකභාවය, ප්‍රමාණවත් නෛතික බැඳීම් ඇතුලු මූලික අවශ්‍යතාවයන් ආරක්ෂා වන පරිදි ලංසුකරුවන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය පිළිගත හැකි මට්ටමකට ලිහිල් කර තරඟකාරීත්වය උපරිම කර ගැනීම පිළිබඳ ව අවධානය යොමු කිරීම.
3. ලංසු ලේඛනයන්ට සංශෝධනයන් සිදු කිරීමේ දී අදාළ කඟවුරු කිරීම් හා බැඳීම්වලට අගතියක් නොවන පරිදි එවැනි සංශෝධනයන්ගේ නීත්‍යානුකූලභාවය තහවුරු කර ගැනීමෙන් පසුව එවැනි සංශෝධනයන් සිදු කළ යුතු අතර, එම සංශෝධනයට ගැලපෙන පරිදි ලංසු ලේඛනයෙහි අනෙකුත් වගන්ති හා ගිවිසුම් සංශෝධනය කිරීමට වග බලා ගත යුතුය. ලංසු කැඳවීමෙන් පසු, ලංසු ලේඛනයන්ට ප්‍රබල සංශෝධනයක් කිරීමෙන් හැකි සෑම විටම වැළකී සිටිය යුතුය. ලංසු ලේඛනවලට පසුව කරන සංශෝධනයන්හිදී එම සංශෝධනයන්ට අනුගත වීම සඳහා සියළුම ලංසුකරුවන්ට සාධාරණ කාලයක් ලබා දීමට ක්‍රියා කිරීම.
4. ගල් අඟුරු ප්‍රසම්පාදනයේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව සකස් කළ යුතු ප්‍රසම්පාදන සැලැස්ම පරිපූර්ණ ලෙස, විධිමත්ව සකස් කර, අනුමත කර එයට අනුගතව කටයුතු කළ යුතු වීම සහ කාලීනව ගල් අඟුරු සැපයීම තහවුරු වන පරිදි මූල්‍ය සම්පාදනයන් පිළිබඳව පූර්ව එකඟතාවයක් ලබාගැනීමේ හැකියාව පිළිබඳව අවධානය යොමු කිරීම.
5. එසේ එක් සැපයුම්කරුවෙකුට වැඩි සංඛ්‍යාවකගේ එකතුවකින් ප්‍රසම්පාදනය සඳහා කටයුතු කරන්නේ නම් එම එකතුවය නෛතික පුද්ගලභාවයක් ඇති බවට තහවුරු කර ගත යුතු අතර එයට තිබිය යුතු ශක්‍යතාවයන් හා නෛතික

බැඳීම් දැඩිව තහවුරු වන පරිදි ලංසු ලේඛන හා ගිවිසුම් ශක්තිමත් කර ගුණාත්මක ගල් අඟුරු තොග කාලීනව ලැබීම තහවුරු කර ගත යුතුය.

6. ගල් අඟුරු ප්‍රසම්පාදනයට අදාළ සංයුක්ත දර්ශක තීරණය කිරීමේ දී උපරිම ආර්ථික වාසියක් රජයට ලබා ගත හැකි පරිදි එම දර්ශක සකස් කිරීමට යොදා ගන්නා කලාපීය දර්ශක පිළිබඳ ව කාලීනව නැවත සලකා බැලීමට කටයුතු කිරීම.
7. 2022.09.22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙහි විවෘත ජාත්‍යන්තර ටෙන්ඩර් ක්‍රියාවලිය අනුගමනය කරමින් හා දැනට ලියාපදිංචි සැපයුම්කරුවන්ට ද ප්‍රසම්පාදනයට සහභාගීවීමට අවස්ථාව ලබාදෙමින් ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට අනුමැතිය ලබා දී තිබුණු අතර විවෘත ජාත්‍යන්තර ටෙන්ඩර් ක්‍රියාවලියක් ආරම්භ කිරීමේ දී ගල් අඟුරු සමාගම විසින් දැනට සැපයුම්කරුවෙකු ලියාපදිංචි කිරීමේ මූල්‍ය හා තාක්ෂණික ශක්‍යතාවය ඇගැයීමට ලක් කරනු ලබන අවම මූලික සුදුසුකම් ලංසු ලේඛනවල ලංසු කරුවන් ඇගැයීමේ නිර්ණායක ලෙස ඇතුළත් කිරීම.
8. මෙම ප්‍රසම්පාදනයන්ට අදාළව වඩාත් ප්‍රශස්ථ අනුමැතීන් ලබා දිය හැකි වන පරිදි අවශ්‍ය අධ්‍යයනයන් සිදු කිරීමට සහ තොරතුරු ලබාගැනීමට ප්‍රමාණවත් කාලයක් අමාත්‍ය මණ්ඩලය වෙත ලැබෙන පරිදි නිවැරදි තොරතුරු අප්‍රමාදව ඉදිරිපත් කිරීමට අදාළ නිලධාරීන්ට නියම කිරීම.

මෙහිදී ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් විසින් උක්ත නිර්දේශ සම්බන්ධව පහත සඳහන් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇති බව කාරක සභාවට වාර්තා කරන ලදී.

- විගණකාධිපති විසින් සඳහන් කරනු ලැබූ අඩුපාඩු සියල්ලම දැනට කැඳවා ඇති ටෙන්ඩරය සම්බන්ධයෙන් නිවැරදි කර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කිරීම.

- කැබිනට් මණ්ඩලයෙන් ලබා ගත යුතු අවශ්‍ය සියලුම අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කිරීම.

- නීතිපතිගෙන් ලබා ගත යුතු අවශ්‍ය සියලුම අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කිරීම.

8. <u>පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ</u>

i. නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය සඳහා 2022-2025 කාලපරිච්ඡේදයට අදාළව ගල් අඟුරු මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඇගැයීම සම්බන්ධයෙන් විශේෂ වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කිරීම.

ii. මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධව විගණකාධිපතිගේ නිර්දේශ එලෙසින්ම අනුමත කිරීම.